නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

நேஷனல் பேப்பர் கம்பெனி லிமிடட்

National Paper Company Limited

NPCL



වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கைகள்

Annual Report

2016 - 2017

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

Ministry of Industry and Entrepreneurship Development

වාර්ෂික වාර්තා, ගිණුම් ප්‍රකාශණ සහ ස්වාධීන විගණන වාර්තා

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්

වාර්ෂික වාර්තාව

2017.03.31 දිනෙන් අවසන් වන වසර සඳහා

INDEX

අන්තර්ගතය	පිටු අංක
1. සභාපතිතුමාගේ පණිවුඩය	01
2. වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය 2025	03
3. දැක්ම සහ මෙහෙවර	05
4. 2017.03.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන	
4.1 සංස්ථාපිත තොරතුරු	09
4.2 අධ්‍යක්ෂවරුන්ගේ වාර්ථාව	10
4.3 විගණකවරුන්ගේ වාර්ථාව සහ මූල්‍ය ප්‍රකාශන	11

உள்ளடக்கம்	பக்க இல.
1. தலைவரின் செய்தி	01
2. பணிப்பாளர் குழாத்தினர் 2025	03
3. இலக்கு மற்றும் நோக்கக் கூற்று	05
4. 2017 மார்ச் 31 உடன் முடிவடையும் வருடத்துக்கான நிதிக் கூற்றுக்கள் பொருளடக்கம்	
4.1 கூட்டிணைக்கப்பட்ட தகவல்கள்	09
4.2 பணிப்பாளர்களின் அறிக்கை	10
4.3 கணக்காய்வாளர்களின் அறிக்கை மற்றும் நிதிக் கூற்றுக்கள்	11

Contents	Page No.
1. Message from the Chairman	01
2. Incumbent Board of Directors 2025	03
3. Vision & Mission	05
4. Financial Statements for the Year Ended 31 March 2017	
4.1 Corporate information	09
4.2 Report from the Directors	10
4.3 Auditors' Report and Financial Statements	11



සභාපතිතුමාගේ පණිවුඩය

සීමාසහිත ජාතික කඩදාසි සමාගම නමින් ශ්‍රී ලංකාවේ කඩදාසි කර්මාන්තයේ නියමුවා ලෙස විරුදාවලිය ලත්, 1956 වසරේ සිට වර්තමානය දක්වා දශක 7කට ආසන්න කාලයක් ජාතික කඩදාසි අවශ්‍යතාවය සපුරාලමින් ඉතා විශාල මෙහෙයක් ඉටු කරනු ලැබූ මෙම ආයතනය 1992 වසරේ රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද අතර 1995 සහ 1996 යන වසර වල ජාතික ඵලදායිතා සම්මානයෙන් පිදුම් ලද ආයතනයකි.

2020 වන විට සම්පූර්ණයෙන්ම අකර්මණ්‍යව පැවති චාලච්චේන සහ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් ද්විත්වයට පණ ලබාදෙමින් කටයුතු කල පෙර සභාපති විමල් රූපසිංහ මහතාගේ කාර්යභාරය මම ඉතාමත් සතුටින් සිහිපත් කරන අතර මා ඇතුළු වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය 2024 නොවැම්බර් මස සිට පාලනාධිකාරයට පත් වූ අතර දේශයේ කඩදාසි කර්මාන්තය පසුබෑමට ලක්ව ඇති මොහොතක කඩදාසි වෙළඳ පොළ තුල නැවත ස්වයං මූල්‍යනයක් යටතේ ජාතික කඩදාසි සමාගම ස්ථානගත කිරීමට මා හට පැවරුණු අභියෝගය ඉතා සතුටින් භාරගත් අතර නිෂ්පාදන ධාරිතාවද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට උපායශීලි ක්‍රියාමාර්ග අනුගමනය කර මෙහෙයුම් ලාබයක් ලබාගනිමින් ක්‍රියාත්මක කිරීමට හැකි විය.

මේ වන විට ජාතික කඩදාසි සමාගමේ 2016 සිට 2017 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය අවසන් කර ඇත. එය වාර්ෂික වාර්ථාවක් ලෙස සකස් කර ඉදිරිපත් කිරීමට අප වර්තමාන කාර්යය මණ්ඩලයට හැකිවී ඇත. 2014/2015 වර්ශයේ සිට මේ දක්වා වාර්ෂික ගිණුම් සකස් කර නොතිබීමද අපකාර්යය මණ්ඩලයට ලද තවත් අභියෝගයක් වූ අතර 2020 වර්ෂයේ සිට වාර්ෂික අවසාන ගිණුම් සහ වාර්ෂික වාර්ථා ක්‍රමානුකූලව නිසි පරිදි සකස් කල යුතු බැවින් පසුගිය දත්ත මත පදනම්ව ඉතාමත් කෙටි කලක් ඇතුලත 2016/2017 වර්ෂයෙහි වාර්ෂික වාර්ථාව සකස් කොට අවසන්කර මෙසේ ඉදිරිපත් කිරීම, මාගේ ධුර කාලය තුල මා භාර ගත් අවිනිශ්චිත වගකීමක් වන අතර අප සතුව තිබූ දත්ත ඇසුරෙන් මෙම වාර්තාව හෝ ඉදිරිපත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මා සතුටට පත්වෙමි.

අතීතයේ පැවැති විවිධ හැලහැප්පීම් බාධක පරයමින් වර්ථමාන තරකාරී වෙළඳ පොළ තුල යලි ජාතික කඩදාසි සමාගමේ ස්වාධිපත්‍ය පතුරුවාලීමට අවශ්‍ය සියළු ආකාරයේ තීන්දු තීරණ ගනිමින් සෑම අවස්ථාවකම මා දිරි ගන්වමින් සහ සහයෝගය ලබා දෙමින් කටයුතු කරනු ලබන ගරු අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා ඇතුළු එම කාර්යය මණ්ඩලය මෙන්ම මහා භාණ්ඩාගාරයේ නිලධාරී මඩුල්ලද ඉතාමත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

එමෙන්ම ආයතනයේ ක්‍රියාකාරකම් නිරතුරුව අධීක්ෂණය කරමින් අවශ්‍ය මග පෙන්වීම ලබා දෙමින් අප කෙරේ විශ්වාසයෙන් යුතුව කටයුතු කරන අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලය සහ අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය දේශීය කඩදාසියේ අනාගතය ගොඩනගන්නට මා වෙත ලබා දෙන මහඟු ශක්තියද ගෞරවයෙන් සිහිපත් කරන අතර කඩදාසි කර්මාන්තයේ පෙරගමන්කරුවන් ලෙස ශක්තිමත්ව සාමූහිකව මා සමග අත්වැල් බැඳගනිමින් ජාතික කඩදාසි සමාගමේ උන්නතිය උදෙසා කැපවන සමාගමේ සේවක මඩුල්ලද ඉතාමත් සතුටින් හෘදයාගමව සිහිපත් කරමි.

ඉංජිනේරු ආර්.එම්.එස්.උපාලි රත්නායක
සභාපති
ජාතික කඩදාසි සමාගම

2025

සභාපතිතුමා ඇතුළු වර්ථමාන අධ්‍යක්ෂ මණ්ඩලය



ඉංජිනේරු ආර්.එම්.එස්. උපාලි රත්නායක මහතා
සභාපති



ඉංජිනේරු ඩබ්ලිව්.ඒ කුලතිලක මහතා
අධ්‍යක්ෂක




කමලනාත් ජිනදාස මහතා
අධ්‍යක්ෂක



එන්.ඒ. නන්දසේන මහතා
අධ්‍යක්ෂක



නිහාල් පෙරේරා මහතා
අධ්‍යක්ෂක



යසුරි ලක්ෂානි විජේසූරිය මහත්මිය
අධ්‍යක්ෂිකා



දිනිදු මුනිදාස මහතා
අධ්‍යක්ෂක

සංස්ථාපිත දැක්ම සහ මෙහෙවර

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ කඩදාසි කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා දායකවීම පිණිස, වර්තමානයේ නිෂ්පාදනය නොකරන මුද්‍රණ කඩදාසි ඡායා පිටපත් කඩදාසි සහ පරිගණක ලිපිද්‍රව්‍ය වැනි කඩදාසි සහ වෙනත් බෝඩ් (පුවරු) නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අලෙවිකරණයේ පෙරගමන්කරුවකු වීම.

අපගේ මෙහෙවර

ඉතා ලාභදායී පරිසර හිතකාමී ගනුදෙනුකරුවන් මූලික කරගත් තාක්ෂණය, මානව සම්පත් සහ විශිෂ්ඨ කළමනාකරණයක් ඇති සියළුම වර්ගවල කඩදාසි සහ බෝර්ඩ් (පුවරු) නිෂ්පාදනය කරනු ලබන සහ අලෙවි කරනු ලබන අතිශයින් නවෝත්පාදනය සහ විවිධාංගිකරණය කළ කඩදාසි සමාගමක් බවට පත්වීම.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

අන්තර්ගතය

2016/2017 මූල්‍ය වර්ෂය

1. සංස්ථාපිත තොරතුරු

2. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ථාව

3. විගණකවරුන්ගේ වාර්ථාව සහ මූල්‍ය ප්‍රකාශන

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සංස්ථාපිත තොරතුරු : 2016/2017

නිසි බළධාරි - කේ.එම්.එස් කන්දෙගෙදර මහතා

<u>සමාගම් ලේකම්වරු</u>

ඩී.එම්.ජේ මැනේජ්මන්ට් ඇන්ඩ් සෙක්‍රටේරියට් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 20/26

දුම්රියපොළ පාර

නුගේගොඩ

<u>ලියාපදිංචි කාර්යාලය</u>

අංක 93, ජාවත්ත පාර

කොළඹ - 05

<u>විගණකවරු</u>

ජාතික විගණක කාර්යාලය

306/72 පොල්දූව පාර

බත්තරමුල්ල

<u>බැංකුකරුවෝ</u>

මහජන බැංකුව

ලංකා බැංකුව

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහිත වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරයි.

1. ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රදාන මෙහෙයුම් ක්‍රියාකාරකම වන්නේ කඩදාසි සහ කඩදාසි පුවරු (පේපර් බෝර්ඩ්) වාලව්චේන කර්මාන්තශාලාවෙහි නිෂ්පාදනය කර ආලවි කිරීමයි.

2.කොටස් ප්‍රාග්ධනය

සීමාසහිත ජාතික කඩදාසි සමගම මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ 100% කොටස් අයිතියකින් යුක්ත රාජ්‍ය අයිතිය සතු ව්‍යාපාර එකකියකි. එහි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 323කි. (එනම් කොටස් ප්‍රාග්ධනය රුපියල් 10/- බැගින් වූ කොටස් 32,300,000 කින් සමන්විත වේ.)

3.පිරිවැටුම

2017.03.31 දිනෙන් අවසාන ගිණුම් වර්ෂයේ සමාගමේ ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 15.96Mn කි.

4. සමාගමේ නිෂ්පාදන පිරිවැය 2.1Mn

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුල වාලව්චේන කම්හලෙහි නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන, 8,842,049 කි.

5. ප්‍රාග්ධන වියදම්

සීමාසහිත ජාතික කඩදාසි සමාගම ප්‍රතිව්‍යුහකරණයට වෙන්වූ දින සිට ප්‍රාග්ධන වියදම් ඉතා අල්ප ප්‍රමාණයකට සීමා කරන ලදී.

6. සමගම සම්බන්ධයෙන් ගිවිසුම් වලට එළඹීමට අධ්‍යක්ෂවරුන් දැක්වූ ඇල්ම

2017.03.31 දිනෙන් අවසන් වර්ෂයේදී සමාගමේ අධ්‍යක්ෂවරු ඍජුව හෝ වක්‍රාකාරව සමාගම සමග ගිවිසුම් වලට එළඹීමට නොහැක.

7.විගණකවරු

සමාගමේ 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන විගණනය කරන ලද්දේ වරලත් ගණකාධිකාරිවරුන් වන ජාතික විගණන කාර්යාලය විසිනි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

2017 මාර්තු 31

මූල්‍ය ප්‍රකාශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඑම/ඩී/එන්පීසීඑස්ඵල්/01/23/224

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ජූලි 04 දින

Revise plan process further with

✓ DCA CF A

@ Pls proceed

සභාපති

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

NATIONAL PAPER COMPANY LTD
09 JUL 2024
Accounts Department
HEADOFFICE

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් -
01. ලේකම් ,කර්මාන්ත අමාත්‍යාංශය
02. ලේකම් , මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. | සිඒඑම/ඩී/එන්පීසීඑස්ඵල්/01/23/224
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date | 2024 ජූලි 04 දින

සභාපති
සීමාසහිත ජාතික කඩදාසි සමාගම

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශනය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) විධිවිධාන අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.1 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

1.2 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මතය ව්‍යාවනය කිරීම යන කොටසේ දක්වා ඇති කරුණු වලට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් පල කිරීමට පදනමක් ඇතිකර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි මට ලබාගත නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 *ව්‍යාවනය කළ මතය සඳහා පදනම*

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 අනුව ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම හඳුනාගත යුතු වුවද සමාගමේ දේපල පිරියත සහ උපකරණ යටතේ ඇති ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැය රු.132,274,693 ක් වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාගමේ මොටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම, පිරිවැය වටිනාකම ඉක්මවා ගණනය කර තිබීම හේතුවෙන් වාර්ෂික අලාභය රු. 532,634 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) 2016 මාර්තු 31 දිනට සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් සමඟ 2016 අප්‍රේල් 01 දිනට පොදු ලෙජරයේ ආරම්භක ශේෂයන් සන්සන්දනය කිරීමෙදී, වත්කම් ගිණුම් ශේෂ 136 කට අදාල රු.3,887,304,944 ක්ද, වගකීම් ගිණුම් ශේෂ 218 කට අදාල රු.3,770,750,351 ක් සහ හිමිකම් ගිණුම් ශේෂ 3 කට අදාල රු.442,884,051 ක් ලෙස රු.8,100,939,346 ක මුළු වෙනස විගණනය වෙත පැහැදිලි කිරීමට කළමණාකාරිත්වය අපෝහොසත් වී තිබුණි.

(ඈ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 148 වගන්තිය පරිදි සමාගමේ ගනුදෙනු නිවැරදි ලෙස වාර්තා කරන හා පැහැදිලි කරන ගිණුම් වාර්තා සහ ආධාරක ලියවිලි තබාගත යුතු වුවද ගිණුම් කාලච්ඡේදයට අදාල ගනුදෙනු හා සිද්ධි සම්බන්ධ ගිණුම් පොත් පත් සහ ගිණුම්කරන සාක්ෂි ආරක්ෂිතව තබාගැනීම සඳහා සමාගමේ නිසි බලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) රු.49,863,660 ක් වූ ආදායම් ගිණුම් ශේෂ 04 ක් ද, රු.95,447,434 ක් වූ වියදම් ගිණුම් ශේෂ 03 ක් ද, රු. 484,423,303 ක් වටිනා දේපල පිරියත උපකරණ, රු.121,020,606 ක් වටිනා අවසන් තොගය, රු.87,755,556 ක් වටිනා වෙළඳ ලැබිය යුතු දෑ, රු.465,449,058 ක් වටිනා වෙනත් ලැබිය යුතු දෑ, රු.38,005,467 ක මුදල් හා මුදල් සමාන දෑ, රු.160,140,052 ක පොළී සහිත ණය, රු.134,645,393 ක වෙළඳ ගෙවිය යුතු දෑ සහ රු.1,387,796,113 ක් වටිනා වෙනත් ගෙවිය යුතු දෑ ලෙස එකතුව රු.3,024,546,642 ක් වූ ගනුදෙනු සහ ගිණුම් ශේෂ තහවුරු කර ගැනීමට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ඊ) 2016/2017 වර්ෂයට අදාල ජාතික කඩදාසි සමාගමේ බැංකු මඟින් සිදු වී ඇති ගනුදෙනු පරීක්ෂාවේදී ලංකා බැංකුවේ ගිණුම් අංක 164807 ට අදාලව සිදුවී තිබුණු වටිනාකම රු.3,932,433 ක් සහ රු.6,600,000 ක ගෙවීම් සහ ලැබීම් ගනුදෙනු 35 කට අදාල තොරතුරු ඉල්ලා සිටි නමුත් කිසිදු තොරතුරක් විගණනට ඉදිරිපත් නොවුණි. ගිණුම් අංක 2699996 ට අදාලව ගනුදෙනු 36 ක තොරතුරු ඉල්ලා සිටි නමුත් ඉන් ගනුදෙනු 27 කට

අදාල වෙක් පත් වල පිටපත් පමණක් විගණනය වෙත ලැබුණු අතර වටිනාකම රු.55,052,258 ක් වූ ගනුදෙනු 9 කට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. එම වෙක් පත් වලට අනුව පුද්ගලයින් 16 කට රු.11,342,643 ක මුදල් වෙක්පත් ද, කම්කරු කොමසාරිස් වෙත එකතු වටිනාකම් වූ රු.44,528,981 ක වෙක්පත් 2 ක් සහ සේවක අර්ථසාධක අරමුදලට වෙක්පත් 2ක් මගින් රු.19,084,250 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් එම වෙක් පත් වලට අදාල ගෙවීම් වවුචර් සහ කිසිදු සනාථන ලිපියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

09 JUL 2024
Accounts
Department

1.4 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

2016 අප්‍රේල් 01 දිනට රු.1,429,185,940 ක් වූ රඳවාගත් ඉපැයුම් සෘණ ශේෂය සමාලෝචිත වර්ෂයේ අලාභය වූ රු.46,888,937 ක් සමඟ රු.1,476,074,877 ක් දක්වා පිරිහී තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ ශුද්ධ වත්කම් රු.1,066,210,292 ක සෘණ අගයක් වූ බවට සාක්ෂි තිබුණි. ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවති.

1.5 මතය ව්‍යාවනය කිරීම

මතය ව්‍යාවනය කිරීම යන ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම නිසා විගණන මතයක් ප්‍රකාශ කිරීමට හැකි පදනමක් ලබා ගැනීමට සුදුසු ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි මට ලබාගත නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් පල නොකරමි.

1.6 වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 සමාගම් පනතේ 163 (2) වගන්තියට අනුව,මම පහත සඳහන් දේ ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මගේ මතය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මට ලබාගත නොහැකි විය. එබැවින් මම මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ මතයක් ප්‍රකාශ නොකරමි.

1.7 වෙනත් කරුණු

(අ) 2015 පෙබරවාරි 09 දිනට ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවීමට නියමිතව තිබූ හිඟ විදුලි බිල වූ රු.483,997,075 ක් නොගෙවීම නිසා එදින සිට වාලව්වෙන කර්මාන්තශාලාවට විදුලිය සැපයීම තාවකාලිකව විසන්ධි කර තිබූ අතර විදුලි සැපයුම නොමැති හෙයින් 2020 ජූනි මාසය දක්වා වාලව්වෙන කර්මාන්තශාලාවේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවී නොතිබුණි. කෙසේ වුවද, 2022 සැප්තැම්බර් 08 දිනැති,

අංක EP/EE(COM)/CS/Bulk Supply දරන ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කළමණාකාරතුමාගේ ලිපියට අනුව හා 2020 මාර්තු 26 දිනැති, අංක අමප/20/0561/224/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, රු. 361,992,685 ක් වූ දඩ පොලිය කපා හැරීමෙන් පසුව ඉතිරි වූ රු.122,004,390 ක හිඟ විදුලි බිල කම්හලෙහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කරන දින සිට වසර දෙකක කාල සීමාවක් ගතවීමෙන් පසුව එළඹෙන මාස හයක කාලසීමාව තුළ වාරික වශයෙන් ගෙවා අවසන් කිරීමේ කොන්දේසියට යටත්ව අනුමැතිය ලබාගෙන, 2020 ජූලි මාසයේ දී කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට කඩදාසි සමාගම විසින් හිඟ විදුලි බිල වූ රු.122,004,390 ක වටිනාකමින් රු.10,000,000 ක් ගෙවා ඇති අතර තවදුරටත් රු.112,004,390 ක වටිනාකමක් තවදුරටත් ගෙවීමට තිබුණි.

(ආ) 2020 ජූලි මස සිට සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ස්ථිර පදනම මත බඳවාගත් සේවකයින් 09 ක්ද, කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 12 ක් සහ දෛනික වැටුප් පදනම් මත බඳවාගත් සේවකයින් 02 ක්ද ලෙස සේවකයින් 23 දෙනෙකු සහ වාලවිචේන කම්හලෙහි කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 06 ක් සහ දෛනික වැටුප් පදනම් මත බඳවාගත් සේවකයින් 120 ක්ද ලෙස සේවකයින් 126 දෙනෙකු ඇතුළුව මුළු සේවක සංඛ්‍යාව 149 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය සඳහා මේතෙක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) වාලවිචේන කඩදාසි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමේදී මහාභාණ්ඩාගාරයේ ඇප සහිතව (Treasury guarantee) 2020 දෙසැම්බර් 09 දින රු. මිලියන 40 ක ණය මුදලක් මාස 06 ක සහන කාලයකට යටත්ව වසර 05 ක කාලයකදී වාරික 54 කින් ගෙවීමේ කොන්දේසි ඇතුලත්ව මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි. තවද, සමාගම විසින් 2021 මැයි මස 17 දින නැවත වරක් රු.මිලියන 100 ක ණය මුදලක් වාලවිචේන කර්මාන්ත ශාලාවේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වසර 05 ක කාලයකදී ගෙවීමට යටත්ව මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි. මෙම ණය මුදල් මහා භාණ්ඩාගාරයේ ඇප සහිතව වෙළඳපල පොළී අනුපාතිකයන් යටතේ ලබාගෙන ඇති අතර රජයේ අමාත්‍යාංශය වන කර්මාන්ත අමාත්‍යාංශයෙන් කිසිදු අනුග්‍රහයක් ජාතික කඩදාසි සමාගම වෙත ලැබී නොතිබුණි.

(ඈ) කම්හලේ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කිරීමට කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය (Paper Machine) සහ බෝඩ් නිෂ්පාදන යන්ත්‍රය (Board Machine) ලෙස ප්‍රධාන යන්ත්‍ර

02ක් පැවතුනද වර්තමානයේදී බෝඩ් නිෂ්පාදන යන්ත්‍රය පමණක් භාවිතා කරමින් පැවතුණි. 2020 වර්ෂයේ නැවත වාලවවෙන කඩදාසි කම්හලේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරගෙනයාමේදී බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයේ අක්‍රිය වන සහ යාන්ත්‍රික දෝෂ ඇති වන අවස්ථා වලදී නිසි ක්‍රියාකාරිත්වය සඳහා කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් කොටස් ගලවා බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයට සවිකිරීම සමාගම අනුගමනය කල ක්‍රමය විය. එලෙස කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් ප්‍රධාන අයිතම 08 ක් බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයට සවිකර ඇති අතර ඒවාහි වටිනාකම රු.34,433,059 ක් විය. ඒ අනුව, විගණිත දිනය වූ 2023.01.22 වන විටත් කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි මට්ටමින් අක්‍රීයව පැවතීම නිසා කාඩ් බෝඩ් නිෂ්පාදනය අඩාල වී තිබුණි.

(ඉ) 2011 දෙසැම්බර් 19 දිනැති අංක 1037 දරන බදු ගිවිසුම අනුව ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව නැවත ප්‍රකෘති තත්වයට පත් කිරීමට හා නැවත සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවකට වර්ෂ 30 ක කාලයක් සඳහා අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05 පිහිටි රාජ්‍ය සම්පත් කළමනාකරණ සමාගම සහ සීමාසහිත ජාතික කඩදාසි සමාගම යන ආයතන යුගලය සහ අංක 03/43, වෙන්ටනොර් ඇවනිව්, බටහිර පර්ත්, බටහිර ඕස්ට්‍රේලියාව ව්‍යාපාරික ලිපිනයැති සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස් (පුද්ගලික) සමාගම අතර ගිවිසුම් ප්‍රකාරව එකඟවූ රුපියල් මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවෙන් රුපියල් මිලියන 200 ක් බදුකරු විසින් විසින් ගෙවා නොතිබුණි. තවද, අදාල සමාගම විසින් සුළු කාලයක් නිෂ්පාදන කටයුතු සිදුකර ඇති අතර පසුව ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව සතු කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය සෙලාන් බැංකුව වෙත රු.418,483,037 ක වටිනාකමකට උකස් තබා 2012 වර්ෂයේදී කම්හල හැර යාමට කටයුතු කර තිබුණි. මෙම උකස නිරවුල් කර ගැනීමට දෙවන බදු කරු විසින් රු.මිලියන 120 ක මුදලක් බැංකුව වෙත ගෙවීමට සිදු වී තිබුණු අතර නිසිපරිදි බදු වාරික නොගෙවීම මත රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති උපදෙස් මත අදාළ බදු ගිවිසුම 2014 සැප්තැම්බර් 25 දින අවලංගු කර තිබුණද 2011 දෙසැම්බර් 19 දින සිට ගිවිසුම අවලංගු කල කාලය වූ 2014 සැප්තැම්බර් 25 දක්වා වූ වර්ෂ තුනක කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු රුපියල් මිලියන 42 ක බදුකුලිය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

එසේම නිෂ්පාදන යන්ත්‍ර සෙලාන් බැංකුව වෙත උකස් තැබීම සඳහා ජාතික කඩදාසි සමාගම නියෝජනය වන පරිදි ගිවිසුමට එළඹි පාර්ශව නිශ්චිතව හඳුනාගෙන එම වගකිවයුතු පාර්ශවයන්ගෙන් සමාගමට සිදුවූ අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ගිවිසුමට එලඹුණු සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස්

(පුද්ගලික) සමාගම නිෂ්පාදන කටයුතු නතර කිරීම හේතුවෙන් ගිවිසුම කඩවීම පිළිබඳව බදුදීමනාකාර පාර්ශවය විසින් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) ජාතික කඩදාසි සමාගමේ ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව 2022 මාර්තු 09 දිනැති බදු ගිවිසුම යටතේ කේඑස්පිඒ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් (පුද්ගලික) සමාගම (KSPA Ambilipitiya Paper Mills private limited) වෙත රු. මිලියන 260 ක ප්‍රතිශ්ඨාවක් මත වසර 30 ක කාලයකට බදු දී ඇත. ගිවිසුම අනුව මාස 18 ක් තුළ නිෂ්පාදන කටයුතු ආරම්භකළ යුතු අතර එම කාල සීමාව තුලදී රු. 13,000,000 ක මාසික බදුකුලී වාරිකයක් බදුගැනුම්කරු විසින් සමාගමට ගෙවිය යුතුය. නිෂ්පාදන කටයුතු ආරම්භකළ පසු බදු ගිවිසුම අනුව විකුණුම් ආදායම මත 3% කට සමාන වටිනාකමක් බදුකුලී වාරිකය ලෙස ගෙවිය යුතුය. කෙසේ වුවද අදාල සමාගම විසින් මෙතෙක් නිෂ්පාදන කටයුතු ආරම්භකර නොතිබුණි.

02. වාර්ෂික වාර්තා සභාගත කිරීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති



සීමාසහිත ජාතික කඩදාසි සමාගම

වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශය

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	*2017*	*2016*
		රු.	*රු.*
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	7	41,169,550	46,492,093
ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ		37,428,597	37,428,597
දීර්ඝ කාලීන ආයෝජන	8	(1,967,061)	(1,964,561)
		76,631,085	81,956,128
ජංගම වත්කම්			
ඉන්වෙන්ටරි	9	121,020,606	121,481,914
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු	10	553,204,613	399,005,027
මුදල් සහ මුදල් සමාන දෑ	11	38,005,467	14,698,735
		712,230,686	535,185,676
මුළු වත්කම්		**788,861,771**	617,141,805
ස්කන්ධය සහ බැරකම්			
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	12	323,000,000	323,000,000
විදේශ ප්‍රදාන		41,777,052	41,777,052
ප්‍රාග්ධන සංචිතය		45,087,534	45,087,534
රඳවාගත් පාඩු		(1,476,074,877)	(1,429,185,940)
		(1,066,210,292)	(1,019,321,355)
ජංගම නොවන බැරකම්			
පොළිය - ධාරක ණය සහ ණය ගැනුම්	13	161,693,450	163,178,655
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	14	1,647,943,513	1,360,937,369
රජයට ගෙවිය යුතු	15	32,281,832	98,945,600
බැංකු අයිරා	16	13,153,268	13,401,535
		1,693,378,613	1,473,284,504
මුළු ස්කන්ධය සහ බැරකම්		**788,861,771**	617,141,805

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.
මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරන ලදි.

.....

අධ්‍යක්ෂ

2021 අගෝස්තු 5

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ලාභ හෝ පාඩු ප්‍රකාශය

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	*2017* *රු.*		*2016* *රු.*	
ආදායම	1	15,967,214		6,074,415	
විකුණුම් පිරිවැය	2	(2,193,270)		(19,907,888)	
දළ ලාභය/ (පාඩුව)		**13,773,944**	86%	(13,833,473)	-228%
වෙනත් ආදායම්	3	45,382,065		120,672,933	
පරිපාලන වියදම්	4	(103,113,344)		(31,012,652)	
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්	5	(2,389,635)		(2,565,292)	
වසර සඳහා මෙහෙයුම් ලාභය/ (පාඩුව)		(46,346,971)		73,261,516	
මූල්‍ය පිරිවැය	6	(541,966)		(1,651,284)	
බදු පෙර ලාභය / (පාඩුව)		(46,888,937)		71,610,232	
ආදායම් බදු වියදම්		-		-	
වසර සඳහා ශුද්ධ ලාභය/ (පාඩුව)		(46,888,937)		71,610,232	

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	*විදේශ ප්‍රදාන*	*ප්‍රාග්ධන සංචිත*	*රඳවාගත් පාඩු*	*එකතුව*
2015 මාර්තු 31 දිනට ශේෂය	323,000,000	41,777,052	45,087,534	(1,500,796,172)	(1,090,931,586)
වසර සඳහා ශුද්ධ ලාභය/(පාඩුව)	-	-	-	71,610,232	71,610,232
2016 මාර්තු 31 දිනට ශේෂය	323,000,000	41,777,052	45,087,534	(1,429,185,940)	(1,019,321,354)
වසර සඳහා ශුද්ධ ලාභය/(පාඩුව)	-	-	-	(46,888,937)	(46,888,937)
2017 මාර්තු 31 දිනට ශේෂය	**323,000,000**	**41,777,052**	**45,087,534**	**(1,476,074,877)**	**(1,066,210,291)**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශ

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	2017	*2016*
	රු.	*රු.*
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය / (පාඩු)	(46,888,937)	71,610,232
ගැලපීම :		
ක්ෂය වීම	5,322,543	5,322,544
මූල්‍ය පිරිවැය	541,966	1,651,284
	(41,024,428)	78,584,060
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
ඉන්වෙන්ට්‍රිවල (වැඩිවීම)/අඩුවීම	461,308	14,793,977
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම	(154,199,586)	(87,469,316)
දිගු කාලීන ආයෝජන වල (වැඩිවීම)/අඩුවීම	2,500	-
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම	287,006,144	(1,827,853)
රජයට ගෙවිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම	(66,663,769)	(1,735,654)
	25,582,170	2,345,213
ගෙවූ මූල්‍ය පිරිවැය	(541,966)	(1,651,284)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**25,040,204**	693,930
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්කර ගැනීම	-	(216,689)
ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ	-	(198,675)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	-	(415,364)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
ලැබුණු ණය	-	2,402,527
දීර්ඝ කාලීන ණය නැවත ගෙවීම	(1,034,695)	(818,722)
ගෙවූ බදු කුලී	(450,510)	(3,093,750)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(1,485,205)**	(1,509,946)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	**23,554,999**	(1,231,380)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	1,297,200	2,528,580
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ	**24,852,199**	1,297,200
මුදල් සහ මුදල් සමාන දෑ විශ්ලේෂණය		
මුදල් සහ මුදල් සමාන දෑ *(සටහන - 11)*	38,005,467	14,698,735
බැංකු අයිරාව *(සටහන - 16)*	(13,153,268)	(13,401,535)
	24,852,199	1,297,200

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා පූර්ණ සංඛ්‍යාත්මක කොටසක් සකස් කරයි.

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

1 සංස්ථාපිත තොරතුරු

1.1 සාමාන්‍ය

සීමාසහිත ජාතික කඩදාසි සමාගම, ("සමාගම") 1992 ජූලි 01 දින සිට ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර පවත්වාගෙන යන පූර්ණ අයිතිය සහිත රජයේ සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක.93, ජාවත්ත, කොළඹ 05 ලිපිනයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්හි ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කඩදාසි සහ ඝන කඩදාසි සෑදීමයි.වසර තුලදී සමාගම ප්‍රධාන මෙහෙයුමෙහි ක්‍රියාත්මක නොවිණි.

1.3 නිකුත් කිරීම සඳහා බලය ලබා දීම

2015 මාර්තු 31 දිනෙන් අවසන් වන වසර සඳහා නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශ, නිකුත් කිරීම සඳහා නිසි බලධාරියා විසින් 2018 නොවැම්බර් 05 දින බලය ලබා දෙන ලදි.

1.4 අඛණ්ඩභාවය

2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගම රුපියල් 123,638,759/-ක ශුද්ධ ලාභයක් ලබා ඇති අතර (2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රුපියල් 209,226,700/-ක්) සහ, එම දිනය වන විට සමාගමේ වත්මන් වගකීම් රු. 1,015,079,581/- කින් වත්මන් වත්කම් ඉක්මවා යන අතර (2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුල රු. 950,100,134/-) එහි මුළු වගකීම් එහි මුළු වත්කම් රු. 1.090,931,586/- (2014 මාර්තු 31 න් අවසන් වූ වසර තුල රු. 967,396,084/-) න් ඉක්මවා යයි. තවද වසර තුල රු. 168,212,636/-ක දළ ලාභයක් සිදු වූ වසර තුලදී සමාගම ප්‍රධාන ව්‍යාපාරය මෙහෙයවා නොමැති අතර (2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රු. 181,946,583/-) අමාත්‍යාංශය විසින් ලබා දෙන මූල්‍ය ආධාර මත දැඩි ලෙස රඳා පවතී. මෙම සාධක මගින් සමාගම තව දුරටත් පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් මතු කරයි.

2 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය

2.1 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානයේ ස්වාධීනව පනවනු ලබන වටිනාකම ගණනය කිරීම සඳහා භාවිතා කරන බදුකරණ බලධාරීන්ගේ බදු අනුපාත සහ බදු නීති සඳහා අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන මුදලෙනි.

2.2 විලම්බිත බදු

බදු පාඩු හේතුකොට ගෙන විලම්බිත බදුකරණය සපයා නොමැත.

2.3 මුදල් සහ මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි අභිප්‍රාය සඳහා බැංකුවේ සහ අත ඇති මුදල් වලිනි.

2.4 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කෙරෙනුයේ එදිනෙදා සේවා පිරිවැය , සමුච්චිත ක්ෂය අඩු සහ වටිනාකමේ සමුච්චිත හානි වීම ඉවත් කරමිනි. එම පිරිවැයට ඇතුලත් වනුයේ පිරියත සහ උපකරණයන් හි කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය දැරීමට සිදු වීමේදී හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ වේ නම් ය.

ක්ෂය වීම ගණනය කරනුයේ සෘජු මාර්ග පදනමකින් වත්කම් වල ඵලදායි ජීව කාලය මතය.එක් එක් දේපල,පිරියත සහ උපකරණ සඳහා යොදවන අනුපාත පහත දැක්වේ :

ඉඩම් සහ ගොඩනැගිලි	වසර 40
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	වසර 10
මෝටර් රථ	වසර 4
යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	වසර 15
ක්‍රියාවලියට අයත් දෑ	වසර 15
පරිගණක	වසර 5
උපයෝගිතා	වසර 15

යම් කිසි අයිතමයක් පිළිගනු නොලබනුයේ එය බැහැර කිරීම මත සහ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කල නොහැකි වීම මත ය.වත්කම් පිළිගනු නොලැබීම මත හටගන්නා වාසිය හෝ පාඩුව (ශුද්ධ අපහරණ උත්පාදන සහ වත්කම් වල ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) වත්කම පිළිගනු නොලබන කාලපරිච්ඡේදයේ ලාභ හෝ පාඩු ප්‍රකාශයට අන්තර්ගත කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

2.4 මුලින් තක්සේරු කරන ලද කාර්යය සාධන ප්‍රමිතියෙන් බලාපොරොත්තු වන ආර්ථික ප්‍රතිලාභ නැවත පිහිටුවීම හෝ නඩත්තු කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දැරීමට සිදුවිය හැකි වියදමක් ලෙස සැලකේ.

වත්කම් හි අවශේෂ වටිනාකම,ඵලදායී ජීවකාලය සහ ක්ෂය ක්‍රමය එක් එක් මූල්‍ය කාල සීමාව අවසානයේ දී සමාලෝචනය කර, සුදුසු නම් සකස් කරනු ලැබේ.

2.5 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

a) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්-පාරිතෝෂික

සේවකයන් ඒ සඳහා සුදුසුකම් ලැබූ විට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.2014 මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා සම්පූර්ණ පාරිතෝෂික ප්‍රතිපාදන සකස් කර ඇති අතර 2017 මාර්තු 31න් අවසන් වූ වසර සඳහා පාරිතෝෂික දීමනාවක් ලබා දී නොමැත.එසේම සැලකිව යුතු විශ්‍රාමික සේවකයන් සංඛ්‍යාවක් නීතිමය ක්‍රියාමාර්ග මගින් ඔවුන්ගේ පාරිතෝෂිකය ඉල්ලා ඇති අතර එම අධිකරණ නඩු තවදුරටත් විභාග

b) නිශ්චිත සහභාගී සැලසුම්-සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ති භාරකාර අරමුදල

අදාළ සංස්ථාපිත රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සේවකයන් සුදුසුකම් ලබයි.සමාගම සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වනු ලබයි.

කෙසේ වෙතත් සමාගමේ ප්‍රතිපත්තිය වූයේ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරණ සේවා නියුක්ති භාරකාර අරමුදල් පනත යටතේ පිළිගත නොහැකි වන හෙයින්සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ති භාරකාර අරමුදල කොන්ත්‍රාත් සේවකයින්ගෙන් අඩු නොකිරීමයි.

2.6 ඉන්වෙන්ටරි

අභාවිත සහ සෙමින් චලනය වන අයිතම සඳහා ගෙවිය යුතු දීමනා ලබා දීමෙන් පසු, පහල පිරිවැයක් සහ ලබාගත හැකි ශුද්ධ අගයක් සඳහා ඉන්වෙන්ටරි අගයනු ලැබේ. ශුද්ධ උපලබ්ධි කල හැකි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පටිපාටියෙන් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමෙනි.

ඉන්වෙන්ටරිය එහි වර්තමාන පිහිටීම සහ තත්ත්වයට ගෙන ඒමට දැරූ පිරිවැය හරිත මධ්‍යන්‍ය තක්සේරු කිරීමේ පදනම සඳහා ගිණුම්ගත කරනු ලැබේ.

2.7 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත කර ඇති ප්‍රමාණයන්ගෙනි. වෙනත් ලැබිය යුතු දෑ හඳුනා ගැනෙනුයේ වෙනත් ලැබිය යුතු දෑ හි හානිකරණයෙන් පිරිවැය අඩු කිරීමෙනි.

2.8 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

ප්‍රතිපාදන හඳුනා ගැනෙනුයේ සමාගම සතුව පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්මුතික) පවතින විටය, බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුලත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇතැයි සැලකිය හැකි අතර බැඳීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් සකස් කළ හැකිය.

කාර්යය මණ්ඩලය විසින් ඔවුන්ගේ කාර්ය මණ්ඩල බැඳීම් සහ උසස්වීම් ඉල්ලා සිටිමින් ගොනු කළ නඩු පවතී.ඒවා තවමත් විභාග වෙමින් පවතී.

2.9 ආදායම් ප්‍රකාශය

2.10 අයභාරය හඳුනා ගැනීම

අයභාරය යනු සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතා ප්‍රමාණයට පිළිගැනීම වන අතර දැරීමට සිදුවූ සහ සිදුවන අයභාරය සහ ඒ ආශ්‍රිත පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

අයභාරය මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමෙනි.

අයභාරය හඳුනා ගැනීමේ අරමුණ සඳහා පහත දැක්වෙන විශේෂ නිර්ණායක භාවිතා කරනු ලැබේ.

a) භාණ්ඩ විකුණුම්

භාණ්ඩ විකුණුම් මගින් අයභාරය හඳුනාගනු ලබන්නේ භාණ්ඩ වල හිමිකමෙහි සුවිශේෂී අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත යොමුකරන ලද විට ය, සාමාන්‍යයෙන් භාණ්ඩය බෙදා හැරීමේදී.

b) පොලිය

අයභාරය හඳුනාගනු ලබන්නේ වත්කම් මත බලපාන පොලී පදනම ගිණුම් සඳහා ගනු ලබන කාල සමානුපාත පදනමක් මත ය.

c) ලාභාංශ

ලාභාංශ ආදායම හඳුනා ගනු ලබන්නේ ගෙවීම ලැබීම සඳහා කොටස්කරුවන්ගේ අයිතිය ස්ථාපිත වූ පසුව ය.

d) වෙනත්

වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

2.11 වියදම් හඳුනාගැනීම

ලාභ සහ අලාභ ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරණ ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමය ඉපයීම අතර වන සෘජු සම්බන්ධය පදනම් කර ගනිමින් ය.ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරණ ලද සියළුම වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශය වෙත අයකරගන්නා ලදි.

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා සමාගම විසින් සමාගමේ කාර්යය සාධනයේ අගය සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ පදනම මත ,"වියදම් කාර්යය" ක්‍රමය අනුගමනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2017 Rs.	2016 Rs.
1) ආදායම		
විකිණුම් ආදායම	4,931,895	6,074,415
ඡායා පිටපත් කොළ විකුණුම්	10,318,000	-
අභ්‍යාස පොත් විකුණුම්	717,319	-
	15,967,214	6,074,415
2) විකිණුම් පිරිවැය		
2016.04.01 දිනට තොග	12,325,651	14,195,701
වසර තුළ නිෂ්පාදන පිරිවැය	-	14,460,469
ඉවත දමන කඩදාසි වියදම්	1,731,962	3,577,369
Stock as at 31.03.2017	(11,864,343)	(12,325,651)
	2,193,270	19,907,888
3) වෙනත් ආදායම්		
පාසිකුඩා ව්‍යාපෘති ආදායම	3,099,135	11,957,400
ලැබුණු ප්‍රදාන- ප්‍රධාන කාර්යාලය	23,035,256	94,079,882
ඉවත දමන කඩදාසි විකුණුම්	18,797,374	14,272,651
ස්ථාවර තැන්පතු මත පොළී ආදායම	16,000	-
වෙනත් ආදායම්	434,300	363,000
	45,382,065	120,672,933
4) පරිපාලන වියදම්		
කාර්ය මණ්ඩල වැටුප් සහ ප්‍රසාද දීමනා	13,976,532	19,387,340
ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ - සේවක අර්ථ සාධක අරමුදල සහ සේ	1,444,027	2,525,288
- පාරිතෝෂික	-	-
කුලී සහ වරිපනම්	2,686,320	2,745,895
කාර්යය මණ්ඩල සුභසාධන	83,309	118,601
කොන්ත්‍රාත් කාර්යය මණ්ඩල දීමනා	226,412	498,742
දුරකථන,ෆැක්ස්,භාණ්ඩ ප්‍රවාහන සහ තැපැල් ගාස්තු	468,391	799,833
වාහන කුලී	21,000	465,000
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	184,862	168,089
අළුත්වැඩියා සහ නඩත්තුව	82,249	191,846
විගණන ගාස්තු	15,000	-
නීති සහ වෘත්තීයමය ගාස්තු	162,209	149,300
පුණ්‍යාධාර පරිත්‍යාග	11,000	11,000
ක්ෂය වීම	3,662,944	3,662,944
රක්ෂණ	-	(23,303)
විදුලිය සහ බලශක්තිය	239,136	195,073
ජලය	96,284	127,003
ලේඛණ කටයුතු පිළිබඳව වියදම්	-	(25,000)
පොදු වියදම්	12,030	15,000
දඩ මුදල් අධිභාරය	79,741,640	-
	103,113,344	31,012,652

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

		2017	2016
		Rs.	Rs.
5)	**විකුණුම් සහ බෙදා හැරීම් පිරිවැය**		
	අළුත්වැඩියා සහ නඩත්තුව - වාහන	516,677	816,691
	වාහන සඳහා ක්ෂය වීම	1,659,598	1,659,598
	ගමන් ගාස්තු හා උපවේශන	51,630	97,541
	සංග්‍රහ වියදම්	7,005	(14,923)
	ප්‍රචාරක වියදම්	154,725	6,385
		2,389,635	2,565,292
6)	**මූල්‍ය පිරිවැය**		
	බැංකු ගාස්තු	65,631	91,239
	බදු පොළී	381,044	879,495
	භාරකාර ණය සහ අයිරා ගැණුම් මත පොළිය	95,292	680,550
		541,966	1,651,284

7) **දේපළ, පිරියත සහ උපකරණ**

පිරිවැය	*Balance as at 01.04.2016*	*Additions*	*Disposal*	*Balance as at 31.03.2017*
ඉඩම් සහ ගොඩනැගිලි	132,274,693	-	-	132,274,693
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	15,954,499	-	-	15,954,499
මෝටර් රථ	26,370,600	-	-	26,370,600
යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	470,973,374	-	-	470,973,374
ක්‍රියාවලියට අදාළ දෑ	87,358,241	-	-	87,358,241
පරිගණක	951,630	-	-	951,630
උපයෝගීතා	105,417,606	-	-	105,417,606
	839,300,644	-	-	839,300,644
ක්ෂය වීම				
ඉඩම් සහ ගොඩනැගිලි	115,370,002	451,015	-	115,821,017
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	15,596,325	15,250	-	15,611,575
මෝටර් රථ	25,243,636	1,659,598	-	26,903,234
යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	444,414,352	2,754,283	-	447,168,635
ක්‍රියාවලියට අදාළ දෑ	86,692,349	2,779	-	86,695,128
පරිගණක	566,876	201,818	-	768,694
උපයෝගීතා	104,925,011	237,799	-	105,162,810
	792,808,551	5,322,543	-	798,131,094
Written Down Value	46,492,093			**41,169,550**

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2017 Rs.	2016 Rs.
8) දීර්ඝ කාලීන ආයෝජන		
මහජන බැංකුව සමග ස්ථාවර තැන්පතු	(2,734,584)	(2,734,584)
කාර්යය මණ්ඩල සුරැකුම් ඉතුරුම්	8,042	10,542
සුරැකුම් තැන්පතු - බැංකුව	14,706	14,706
කම්කරු වන්දි අරමුදල	377,005	377,005
සුරැකුම් තැන්පත් - ජාතික ඉතිරිකිරීමේ බැංකුව	4,087	4,087
ආපදා ණය ගෙවීම සඳහා S/A	29,190	29,190
ස්ථාවර තැන්පතුව - මහජන බැංකුව, මඩකලපුව	11,233	11,233
ස්ථාවර තැන්පතුව - වෛද්‍ය යෝජනා ක්‍රම අරමුදල	323,260	323,260
	(1,967,061)	(1,964,561)
9) ඉන්වෙන්ටරි		
අමුද්‍රව්‍ය	6,460,743	6,922,051
නිමි භාණ්ඩ	5,403,600	5,403,600
අමතර කොටස් සහ මෙවලම්	79,523,390	79,523,390
පාරිභෝජ්‍ය අයිතම	29,632,874	29,632,874
	121,020,606	121,481,914
10) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ		
වෙළඳ ලැබිය යුතු දෑ	90,584,790	65,563,145
බොල් ණය සඳහා ප්‍රතිපාදන	(2,829,234)	(2,829,234)
	87,755,556	62,733,910
වෙනත් ලැබිය යුතු දෑ (10.1)	236,294,238	236,294,238
තැන්පතු සහ පෙර ගෙවීම් (10.2)	19,648,048	19,692,041
අංශය වෙතින් ලැබිය යුතු දෑ	209,506,772	80,284,838
	553,204,613	399,005,027
10.1) වෙනත් ලැබිය යුතු දෑ		
කාර්යය මණ්ඩල ණයකරුවන්	(193,910)	(193,910)
කාර්යය මණ්ඩල ණයකරුවන්(Issue of Shoes on Sub.)	9,274	9,274
කාර්යය මණ්ඩල ණයකරුවන්(දුරකථන අයකර ගැනීම්)	325	325
ජාතික ආධුනිකත්ව මණ්ඩලය - දීමනාව	46,692	46,692
කාර්යය මණ්ඩල ණයකරුවන් (කුලී සහ විදුලිය)	238,662	238,662
පුද්ගලික කාර්යය	53,331	53,331
වෙනත් ණයකරුවන් (කාර්යය මණ්ඩලය හැර)	30,074,220	30,074,220
රක්ෂණ සංස්ථා හිමිකම්	15,000	15,000
පිරිනැමූ සේවය- සන්නද්ධ හමුදාව	5,336,013	5,336,013
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ජලය සැප	(9,112)	(9,112)
හියුමන් විෂන් සෙන්ටර්	3,188	3,188
ප්‍රතිපාදන - ඇක්සස් ඉන්ජිනියරින් සමාගම	72,926	72,926
වොන්ලන් ඉදිකිරීම් පුද්ගලික සමාගම	2,057	2,057
පෙරහන් යන්ත්‍රෝපකරණ කොන්ත්‍රාත් සේවකයන්	6,137,049	6,137,049
වැටුප් අත්තිකාරම්	2,224,675	2,224,675
බයිසිකල් අත්තිකාරම්	8,750	8,750
උත්සව අත්තිකාරම්	357,870	357,870
ඉදිරියට ගෙන යන ශේෂය	44,377,008	44,377,008

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2017 Rs.	2016 Rs.
10.1) වෙනත් ලැබිය යුතු දෑ	44,377,008	44,377,008
ඉදිරියට ගෙන ආ ශේෂය	119,909	119,909
ආපදා ණය	15,217	15,217
ආපදා ණය පසුගිය ලැබීම් ගිණුම	96,925	96,925
ගමන් අත්තිකාරම්	775,938	775,938
කලම්බු පර්වෙසස් සඳහා අත්තිකාරම්	5,992,031	5,992,031
ආනුෂංගික වියදම් සඳහා අත්තිකාරම්	97,717	97,717
ප්‍රතිපාදන - Machine Clothing No: II M/c.	389,031	389,031
ප්‍රතිපාදන - Machine Clothing No: II M/c.	1,445,078	1,445,078
ඉන්ඩෙන්ටු තැන්පතු	882,506	882,506
වෙනත් තැන්පතු	21,900	21,900
තැන්පතු P.M.G.(දුරකථන)	53,055	53,055
තැන්පතු හිස් බඳුන්	55,416	55,416
ලැබිය යුතු පොළිය සඳහා ප්‍රතිපාදන	(2,258,808)	(2,258,808)
S.R.M.C.	213,793,727	213,793,727
ඉන්වෙන්ටරි වත්කම්	(36,679,597)	(36,679,597)
භාරකාර ණය සහ අයිරා මත පොළිය සඳහා ප්‍රතිපාදන	7,103,561	7,103,561
තැන්පතු - දුරකථන	13,625	13,625
	236,294,238	236,294,238
10.2) තැන්පතු සහ පෙරගෙවුම්		
කාර්යය මණ්ඩල ණයකරුවන්	36,737	36,737
ආපදා ණය	101,598	101,598
උත්සව අත්තිකාරම්	12,050	12,050
විශේෂ අත්තිකාරම්	3,430	3,430
වාහන ණය	25,850	25,850
වැටුප් ගැලපීම	406	406
වැටුප් අත්තිකාරම්	484,478	558,978
වරාය අධිකාරිය	340,156	340,156
නාවික කටයුතු ඇපය, ඉන්ඩෙන්ටු තැන්පතුව	446,932	446,932
කුලී තැන්පතු	1,007,598	1,007,598
ප්‍රාංකන යන්ත්‍ර තැන්පතු	16,000	16,000
දුරකථන තැන්පතුව	64,879	64,879
තැන්පතුව - සලාකා	3,000	3,000
අත්තිකාරම් තැන්පතු	200,000	200,000
මිලදී ගැනීම් නිශ්කාෂන ගිණුම්	46,921	46,921
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - VCH	191,695	191,695
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - Emb	641,999	641,999
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - Vch (අමතර කොටස්)	476,819	476,819
ඉන්ඩෙන්ටු නිශ්කාෂන - Emb (අමතර කොටස්)	48,605	48,605
වෙනත් තැන්පතු	197,770	197,770
මුදල් අත්තිකාරම් -දේශීය මිලදී ගැනීම්	2,125,111	815,411
සාවද්‍ය ගිණුම	1,438,245	1,438,245
සුභසාධක මුදල් අත්තිකාරම්	(1,277,539)	1,662
ඉදිරියට ගෙන යන ශේෂය	6,632,739	6,676,739

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2017 Rs.	2016 Rs.
10.2) තැන්පතු සහ පෙරගෙවීම්		
ඉදිරියට ගෙන ආ ශේෂය	6,632,739	6,676,739
පොදු පෙරගෙවීම	246,081	246,081
ගමන් අත්තිකාරම	34,400	34,400
තැන්පතුව - ප්‍රචාරක දැන්වීම් කොන්ත්‍රාත්තුව	5,750	5,750
මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්	34,260	34,260
රක්ෂණ සංස්ථාව	377,944	377,944
ඒ.සී.ඊ.කාගෝ	9,941	9,941
රජයේ ලෝහ භාණ්ඩ සංස්ථාව	900,000	900,000
ආර්ථික සේවා ගාස්තුව	3,241,368	3,241,368
Prov.Elc. Receivable on H/O.Bld	19,352	19,352
ලැබිය යුතු දුරකථන සඳහා ප්‍රතිපාදන	12,628	12,628
රැඳවුම් බද්ද	7,559,866	7,559,860
අධ්‍යයන චාරිකා	57,631	57,631
සේවා සඳහා අත්තිකාරම	516,088	516,088
	19,648,048	19,692,041
11) මුදල් සහ මුදල් සමාන දෑ		
මහජන බැංකුව - 2479	1,697,468	-
ජාතික සංවර්ධන බැංකුව (NDB) 316602	84,344	92,762
අත ඇති මුදල්	131,037	131,037
විවිධ ගෙවීම් අග්‍රිමය	189,998	204,653
අයකැමීගේ අග්‍රිමය	4,975	4,975
අග්‍රිමයෙන් සිල්ලර විකිණුම්	3,000	3,000
මුදල් අග්‍රිමය W/P කිරුළපන	73,959	73,959
මුද්දර අග්‍රිමය	21,321	21,321
මහජන බැංකුව - 210898	1,087	-
මහජන බැංකුවේ ඇති මුදල් - යුනියන් පෙදෙස, කොළඹ	7,931	7,931
මහජන බැංකුවේ ඇති මුදල් - ත්‍රිකුණාමලය ශාඛාව / මඩකලපුව	7,591	7,591
සංක්‍රමණ මුදල්	13,500,000	13,500,000
ලංකා බැංකුවේ ඇති මුදල් - මඩකලපුව	651,506	651,506
ලංකා බැංකුව 164807	21,631,251	-
	38,005,467	14,698,735
12) ප්‍රකාශිත ප්‍රාග්ධනය		
මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබූ ප්‍රකාශිත ප්‍රාග්ධනය	323,000,000	323,000,000
	323,000,000	323,000,000

13) පොළී - ණය සහ ණය ගැනුම් දැරීම

13.1) ණය	As at 01.04.2016	Loans Obtained / Int TFR to P&L	Repayment	As at 31.03.2017
KFW ණය	159,654,648	-	-	159,654,648
පරන්තන් කෙමිකල්ස් - ණය	300,000	-	-	300,000
ලංකා බැංකු ණය ගිණුම් අංක. 77522444	1,164,409	-	(987,120)	177,289
ලංකා බැංකු ණය ගිණුම් අංක 77522563	55,691	-	(47,575)	8,116
	161,174,748	-	(1,034,695)	**160,140,052**

13.2) මුදල් බදු

	As at 01.04.2016	Leases Obtained	Repayment	*As at 31.03.2017*
බදු - 8822 : HCLELE1200063800				
බදු - 8825 : HCLELE1200063700	450,510	-	(450,510)	-
බදු - 8709 : HCLELE1200063600	1,553,398	-	-	1,553,398
	-	-	-	-
	2,003,907	-	(450,510)	**1,553,398**

	2017 *Rs.*	*2016* *Rs.*
14) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ		
වෙළඳ ගෙවිය යුතු දෑ	134,645,393	146,388,237
වෙනත් ගෙවිය යුතු දෑ (14.1)	1,467,467,276	1,168,999,647
කොටිඨාශයට ගෙවිය යුතු දෑ	-	-
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ (14.2)	45,830,843	45,549,485
	1,647,943,513	1,360,937,369
14.1) වෙනත් ගෙවිය යුතු දෑ		
විකුණුම් සමග ගෙවිය යුතු පියවීම්	(4,326,767)	(4,326,767)
ඇඹරුම් යන්ත්‍ර ගෙවිය යුතු	1,435,757	1,435,757
ගණුදෙනුකරු වෙතින් ලද අත්තිකාරම	821,011	821,011
විවිධ ණයකරුවන් - ඉවත දමන කඩදාසි	29,024,960	27,566,297
ගෙවිය යුතු වෘත්තීය සමිති සහ රක්ෂණ	26,552	22,690
විවිධ ණයකරුවන්-පොදු මිලදී ගැනීම්	424,663	424,663
විවිධ ණයකරුවන්- W.P.-පැරණි	5,168,230	5,168,230
කල් ඉකුත් වූ චෙක්පත් ගිණුම	169,319	169,319
විවිධ ණයකරුවන්- කුලී	3,063,323	3,063,323
ප්‍රවාහන කොන්ත්‍රාත්කරු	699,706	699,706
Clearing Chgs -V.V. Karunaratne	(150,000)	(150,000)
ගණුදෙනුකරු තැන්පතු	42,850,007	20,078,680
නැවත ලබාදිය හැකි තැන්පතුව	3,169,479	2,184,979
නැවත ලබාදිය හැකි බඳුන් තැන්පතුව	4,417	4,417
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානය	104,900,930	104,900,930
මුදල් ගෙවූ අත්තිකාරම - ඉවත දමන කඩදාසි	825,489	825,489
අමාත්‍යාංශයෙන් ලද ප්‍රදානය	324,784,692	34,260,504
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානය - VCH Boile	23,249,642	23,249,642
කලින් ගෙවන ලද මුදල්. (අවිනිශ්චිත)	24,500	24,500
වැටුප් පාලන ගිණුම	(883,360)	(167,377)
වැටුප් පාලන ගිණුම - කොන්ත්‍රාත්	(333,159)	(131,101)
නොගෙවූ වැටුප	113,112	113,112
උපචිත වගකීම්	491,808	561,708
මහ බැංකුව - සේවක අර්ථ සාධක අරමුදල	27,817,126	41,349,127
මහ බැංකුව - සේවක අර්ථ සාධක අරමුදල අධිභාර	12,839,508	13,126,153
සේවා නියුක්ති භාරකාර අරමුදල	(1,432,074)	3,642,525
නැවත ගෙවිය හැකි පිරිවැටුම් බද්ද	1,741,638	1,741,638
ගෙවිය යුතු කුලී	13,769,261	11,082,941
ගෙවිය යුතු දුරකථන	29,756	66,985
ඉදිරියට ගෙන යන ශේෂය	590,319,525	291,809,081

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2017	*2016*
	Rs.	*Rs.*
14.1) <u>අනෙකුත් ගෙවීම්</u>		
ඉදිරියට ගෙන ආ ශේෂය	590,319,525	291,809,081
ගෙවිය යුතු විදුලිය	162,923	183,494
ගෙවිය යුතු ජලය	(9,625)	6,685
උපචිත වැටුප් සහ වේතන, ගමන්	164,539	164,539
අවලංගු වූ සහ ආපසු එවූ චෙක්පත්	151,691	151,437
හිමිකම් නොපෑ වෛද්‍ය ගෙවීම්	900	900
මුදල් විකුණුම් එකතුව	167,630	167,630
මුදල් විකුණුම් එකතුව (R.S.R.)	7,650,641	7,650,641
නිශ්කාෂණ ගාස්තු ඉන්ඩෙන්ටු - අමතර කොටස්	2,367,662	2,367,662
නිශ්කාෂණ ගාස්තු ඉන්ඩෙන්ටු - R.M.	923,247	923,247
මිනරල් සෑන්ඩ්ස් තාවකාලික ණය	5,000,000	5,000,000
අමාත්‍යාංශ ගිණුම	25,578,996	25,578,996
මහා භාණ්ඩාගාරයෙන් ලද ණය	50,000,000	50,000,000
ඩිමෝ - වාහන ගෙවිය යුතු	44,643	44,643
වෛද්‍ය යෝජනා ක්‍රම අරමුදල	24,057	22,257
Pro.සේවක මණ්ඩල හදිසි අනතුරු අරමුදල	7,617,403	7,617,403
Pro.සේවක මණ්ඩල හදිසි අනතුරු අරමුදල	2,079,946	2,079,946
වන්දි සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රදාන	157,689	157,689
කාර්යය මණ්ඩල සුරැකුම් තැන්පතු	7,506	7,294
ප්‍රතිපාදන - උපචිත ගෙවීම්	8,615,267	8,615,267
ණයකරුවන් පාලනය	3,543,441	3,543,441
උපචිත වැටුප් සහ වේතන	3,478,964	3,478,964
Aus ලංකා පුද්ගලික සමාගම	467,972,042	467,972,042
Fines Mills Emp. (නැවත ගෙවිය හැකි)	147,588	147,588
පොදු නිශ්කාෂණ ගිණුම සේවක අර්ථ සාධක අරමුදල අනියම් /	982,188	982,188
පොදු නිශ්කාෂණ ගිණුම සේවා නියුක්ති භාරකාර අරමුදල අනිය	27,801	27,801
නිශ්කාෂණ ගිණුම දහයියා	7,914,294	7,914,294
ලී කුඩු තොග ගිණුම	139,179	139,179
ප්‍රතිපාදන - දඩ	253,876	253,876
ප්‍රතිපාදන - නොමිලේ තේ (Free Tea)	1,378,348	1,378,348
ප්‍රතිපාදන - විලම්බිත වියදම්	25,000	25,000
ප්‍රතිපාදන-Vahaner Pump House	263,250	263,250
ප්‍රතිපාදන- පාඩු සහ හානි	264,700	264,700
ප්‍රතිපාදන- අධිභාර ලංකා විදුලිබල මණ්ඩලය	231,282,413	231,282,413
Labour Filter Plant & VPH සඳහා ප්‍රතිපාදන	209,836	209,836
උපචිත වැටුප් සහ වේතන	26,281,819	26,281,819
හිමිකම් නොපෑ ගෙවීම්	779,708	779,708
සංයුතිය - මුද්දර ගාස්තු	12,375	12,375
විවිධ ණයකරුවන් - කාර්යය මණ්ඩල පඩිනඩි	11,087,261	11,087,261
නොගෙවූ පාරිතෝෂික	152,465	152,465
කාර්යය මණ්ඩල ණයකරුවන්	122,742	122,742
සේවා නියුක්ති භාරකාර අරමුදල නැවත ලබා දීම	2,882	2,882
නොගෙවූ - ජාතික ආධුනිකත්ව දීමනාව	6,176	6,176
ණයකරුවන් පාලනය - ඉවත දමන කඩදාසි	2,304,974	2,304,974
විවිධ ණයකරුවන් - ගෙවීම් සහ වෙනත්	1,681,453	1,681,453
ඉදිරියට ගෙන යන ශේෂය	1,461,339,419	1,162,863,590

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

	2017	*2016*
	Rs.	*Rs.*
14.1) වෙනත් ගෙවිය යුතු දෑ		
ඉදිරියට ගෙන ආ ශේෂය	1,461,339,419	1,162,863,590
විවිධ ණයකරුවන් - තොග පාලනය	(1,776,949)	(1,776,949)
වෛද්‍ය යෝජනා ක්‍රමය	842,074	842,074
කම්කරු වන්දි අරමුදල	4,051,385	4,051,385
කාර්යය මණ්ඩල සුරැකුම්	4,087	4,087
සුභසාධක සංගමය ලැබුණු වට්ටම්	59,239	59,239
තැන්පත් - කොන්ත්‍රාත්කරුවන්	77,400	77,400
සුරැකුම් තැන්පත් අනියම්	10,000	10,000
තැන්පත් - අභ්‍යන්තර ආපන ශාලාව	25,600	25,600
තැන්පත් -ටෙන්ඩර	2,117,346	2,117,346
ආරක්ෂක බදු	2,000	2,000
ගබඩා අතිරික්ත	8,789	8,789
කුලී සහ විදුලිය ලංකා විදුලිබල මණ්ඩලය	536,821	536,821
මෝටර් රථ රක්ෂණය	41,906	41,906
පෙර ගෙවුම් දුරකථන කුලී සහ බලපත්‍ර අත්හිටුවීම	50,991	50,991
රෙදි සඳහා සහනාධාර විලම්බිත වියදම්	68,068	68,068
සුභසාධක සංගමය අරමුදල	9,100	17,300
	1,467,467,276	1,168,999,647
14.2) ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු NBT	3,843,690	3,826,890
ගෙවිය යුතු ESC	807,583	807,583
ගෙවිය යුතු ආදායම් බදු	3,291,167	3,291,167
ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු	233,683	80,135
ගෙවිය යුතු මුද්දර ගාස්තු	132,578	116,528
ගෙවිය යුතු වැට්	37,522,143	37,427,181
	45,830,843	45,549,485
15) රජයට ගෙවිය යුතු දෑ		
2016.04.01 දිනට ශේෂය	98,945,600	100,681,254
එකතු :- පාරිතෝෂික	-	32,327,589
	98,945,600	133,008,843
අඩු :- විශ්‍රාම පාරිතෝෂික අරමුදල	(34,063,242)	(34,063,242)
	(32,600,526)	-
2017.03.31 දිනට ශේෂය		
	32,281,832	98,945,600
16) බැංකු අයිරා		
මහජන බැංකුව - 210899	50	500
මහජන බැංකුව - 210898	-	2,532
	13,153,268	13,401,535

සීමාසහිත ජාතික කඩදාසි සමාගම

ආදායම් බදු ගණනය කිරීම

2016/2017 තක්සේරු වර්ෂ සඳ හා

		Rs.
ශුද්ධ ලාභය / (අලාභය) බදු පෙර		(46,888,937)
එකතු කරන්න: තහනම් වියදම්		
ක්ෂය වීම	5,322,543	
නීති ගාස්තු	162,209	
පුණ්ය පරිත්යාගය	11,000	
විනෝදාස්වාද වියදම්	7,005	
ප්‍රචාරක වියදම්	38,681	5,541,438
		(41,347,499)
අඩු කළා : ක්ෂය වීමේ දීමනා (සටහන-1)	43,338	(43,338)
මුළු ව්‍යාපාර ආදායම		**(41,390,837)**
අඩු කළා : පාඩු		
පාඩු B / f සිට 2014/2015		
අලාභය ඉල්ලා සිටී		
2016/2017 දක්වා C / f අලාභය	**#VALUE!**	
තක්සේරු කළ හැකි ආදායම		**(41,390,837)**
අඩු කළා : සුදුසුකම් ගෙවීම්		-
බදු අය කළ හැකි ආදායම		**(41,390,837)**
ගෙවිය යුතු ආදායම් බදු @ 28%		

සටහන 01
ක්ෂය වීමේ දීමනාව

අයිතමය	*තක්සේරු වර්ෂය*	*ප්‍රතිශතය*	*පිරිවැය*	ප්‍රාග්ධන දීමනා
ගෘහ භාණ්ඩ සහ උපාංග	2015/2016	20%	206,699	41,340
පරිගණක	2015/2016	20%	9,990	1,998
				43,338



National Paper Company Limited
No: 61, Stratford Avenue, Colombo 05